# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/46 - 2023 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2023.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107අ වගන්තිය යටතේ නියෝග**

සංශෝධිත (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107අ(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වන රනිල් වික්‍රමසිංහ වන මා විසින් පහත නියෝග ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග "**2023 අංක 01 දරන මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීම් - මෙරටට ඇතුල්වන) නියෝග**" වශයෙන් හැඳින්වේ.

2. මෙම නියෝග 2023 මැයි මස 01 වැනි දින සිට නැවත දැනුම් දෙනතුරු බලාත්මක වේ.

3. සංශෝධනය කරන ලද 1993 නොවැම්බර් මස 10 දිනැති අංක 972/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීම් - මෙරටට ඇතුල්වන) නියෝග - 1993 සඳහා 5 උ වශයෙන් අංක කරන ලද නව ඡේදය සහ අ වගුව ඇතුළත් කිරීමෙන් එකී නියෝග තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :

> "කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අංක 01/2023 දරන 2023 අප්‍රේල් 24 දිනැති චක්‍රලේඛයේ දක්වා ඇති සුදුසුකම් ලැබීමේ නිර්ණායකවලට යටත්ව, නැවත මෙරට වෙත පැමිණෙන ද්විත්ව පුරවැසියෙකු ද ඇතුළු ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු, ඔහුගේ/ ඇයගේ ඉපැයීම්වලින් විධිමත් බැංකු මාර්ග ඔස්සේ ප්‍රේෂණ වශයෙන් මෙරටට ප්‍රේෂණය කරන ලද අ වගුවේ (2) වන තීරුවේ දැක්වෙන අවම මුදල් ප්‍රමාණයන් මත පදනම්ව, මාස දොළහකට (12) වරක් අ වගුවේ (4) වන තීරුවේ දක්වා ඇති අතිරේක තීරුබදු නිදහස් දීමනාවකට සුදුසුකම් ලබයි".

අ වගුව

| (1) | (2) | (3) | | (4) | (5) |
|---|---|---|---|---|---|
| තීරු බදු නිදහස් දීමනාවේ කාණ්ඩය | සලකා බලන කාල සීමාව තුළ දී රුපියල් ගිණුමකට ප්‍රේෂණය කළ යුතු අවම ඇමරිකානු ඩොලර් හෝ එවැනි සමාන විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය | මෙරටට පැමිණෙන මගීන් සඳහා දැනට ලබාදෙන තීරු බදු නිදහස් දීමනාව | | අතිරේක තීරු බදු නිදහස් දීමනාව | මුළු තීරු බදු නිදහස් දීමනාව (ඇ.ඩො.) |
| | | අඛණ්ඩව විදේශගත වී සිටි කාල සීමාව | තීරු බදු නිදහස් දීමනාව (ඇ.ඩො.) | | |
| සිල්වර් | 2,400-4,799 | දින 90ට වඩා අඩු | 187.5 | 600 | 787.5 |
| | | දින 90 - 365 අතර | 625.0 | | 1,225.0 |
| | | දින 365ට වැඩි | 1,750.0 | | 2,350.0 |
| සිල්වර්-ප්ලස් | 4,800-7,199 | දින 90ට වඩා අඩු | 187.5 | 960 | 1,147.5 |
| | | දින 90 - 365 අතර | 625.0 | | 1,585.0 |
| | | දින 365ට වැඩි | 1,750.0 | | 2,710.0 |
| ගෝල්ඩ් | 7,200-11,999 | දින 90ට වඩා අඩු | 187.5 | 1,440 | 1,627.5 |
| | | දින 90 - 365 අතර | 625.0 | | 2,065.0 |
| | | දින 365ට වැඩි | 1,750.0 | | 3,190.0 |
| ගෝල්ඩ්-ප්ලස් | 12,000-23,999 | දින 90ට වඩා අඩු | 187.5 | 2,400 | 2,587.5 |
| | | දින 90 - 365 අතර | 625.0 | | 3,025.0 |
| | | දින 365ට වැඩි | 1,750.0 | | 4,150.0 |
| ප්ලැටිනම් | 24,000 හෝ ඊට වැඩි | දින 90ට වඩා අඩු | 187.5 | 4,800 | 4,987.5 |
| | | දින 90 - 365 අතර | 625.0 | | 5,425.0 |
| | | දින 365ට වැඩි | 1,750.0 | | 6,550.0 |

EOG 05 - 0003

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.